# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1986/25 - 2016 සැප්තැම්බර් මස 28 වැනි බදාදා - 2016.09.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

ජාතික ක්‍රීඩා සංගම් නියෝග මාලාවේ 54(3) වගන්තිය යටතේ විධානය

ක්‍රීඩා අමාත්‍ය දයාසිරි ජයසේකර වන මා විසින් ශ්‍රී ලංකා ජූඩෝ සංගමයේ අතුරු පාලන කමිටු කාලසීමාව 2015.07.15 දිනෙන් අවසන් වී ඇති බැවින් නීත්‍යානුකූලව නිලවරණය නැවත පවත්වන තෙක් එම සංගමයේ කටයුතු මැනවින් පවත්වාගෙන යාම සඳහා නිසි බලධාරියා ලෙස ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වන සාමසුන්දර ඒකනායක රාජවර්ධන තෙන්නකෝන් මුදියන්සේලාගේ සමන් ප්‍රියන්ත බණ්ඩාර මහතා පත් කර ඇති බවට 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 39(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ජූඩෝ සංගමය වෙත මෙයින් දැනුම් දෙන අතර, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 41 වගන්තිය යටතේ 2013 අගෝස්තු මස 30 වැනි දින ප්‍රකාශයට පත් කරන ලදුව අංක 1825/38 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* 54(3) වගන්තිය යටතේ සඳහන් වන ජාතික ක්‍රීඩා සංගම් පිළිබඳ රෙගුලාසි ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව,

ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වන සාමසුන්දර ඒකනායක රාජවර්ධන තෙන්නකෝන් මුදියන්සේලාගේ සමන් ප්‍රියන්ත බණ්ඩාර මහතාට ශ්‍රී ලංකා ජූඩෝ සංගමයේ නව නිළධාරී මණ්ඩලය තෝරා ගැනීමේ නිලවරණය කැඳවීම හා පැවැත්වීමට මෙයින් නියම කරමි.

නීතිඥ දයාසිරි ජයසේකර,
ක්‍රීඩා අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 21 වැනි දින,
කොළඹ දී ය.

10 - 295

1A - G 24277 — 17 (2016/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*